**උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (වැඩසටහන් සංරචකය) - 2021**

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ (වැඩසටහන් සංරචකය) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජූලි 17 දින එළඹී අංක 8743 එල්කේ දරන ණය ගිවිසුමේ හා අංක 6026 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09(ආ) ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය හා මූල්‍ය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර රජයේ විශ්වවිද්‍යාල සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ වෛද්‍ය අංශවල ප්‍රමුඛ විෂයයන්ට රජයේ විශ්ව විද්‍යාලවලට, ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීම වැඩිකිරීම, උපාධි වැඩසටහන්වල ගුණාත්මකබව වැඩිදියුණු කිරීම හා උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නව සොයා ගැනීම් දිරිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය සහ මූල්‍ය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,136කට සමාන එජඩො මිලියන 100 මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 මාර්තු 01 දින ආරම්භ කරන ලද අතර 2023 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශචය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

| | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2021 ජනවාරි 01 දිනට විශ්ව විද්‍යාල පහළොවේ සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ උපකරණ, සිවිල් කටයුතු, දර්ශනපති උපාධි වැඩසටහන සහ ඉගෙන ගැනීම, ඉගැන්වීම සහ ඇගයීම වැඩිදියුණු කිරීම/ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකවල සමුච්චිත ශේෂය රු.මිලියන 4,296ක් විය. කෙසේවෙතත්, එම | මෙහෙයුම් කළමනාකරණ සහය කණ්ඩායම් සහ මෙහෙයුම් තාක්ෂණ ලේකම් කාර්යාලවල ගිණුම්වල වාර්තා කරන ලද වාර්ෂික වියදම් අතර වෙනස සඳහා ප්‍රධාන හේතුව සමාලෝචිත වර්ෂය තුළදී දරණ ලද මුළු වියදමට මහා භාණ්ඩාගාරය විසින් ප්‍රමාණවත් නොවන අයවැය | නිවැරදි සමුච්චිත ශේෂය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විශ්වවිද්‍යාලවල මෙහෙයුම් තාක්ෂණ ලේකම්කාර්යාල නවයකින් ලැබුණු තහවුරු කිරීමේ ලිපි අනුව මූල්‍ය ප්‍රකාශනවල අනුරූපී ශේෂය රු.මිලියන 176කින් අඩුවෙන් හා රු.මිලියන 114කින් වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රතිපාදන අනුමත කිරීම වේ. | |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව උපකරණ, සිවිල් කටයුතු සහ උසස් අධ්‍යාපනයෙහි ගුණත්වය වැඩිදියුණු කිරීමට දරන ලද වියදම රු.මිලියන 4,078ක් විය. කෙසේවෙතත්, එම විශ්වවිද්‍යාලවල මෙහෙයුම් තාක්ෂණ ලේකම් කාර්යාලවලින් ලැබුණු තහවුරු කිරීමේ ලිපි අනුව මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂ රු.මිලියන 206කින් අඩුවෙන් හා රු.මිලියන 179කින් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලවලට සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනවලට අග්‍රිම ලබාදීම රු.මිලියන 430ක් විය. කෙසේවෙතත්, විශ්වවිද්‍යාලවල මෙහෙයුම් තාක්ෂණ ලේකම් කාර්යාල දහයෙන් ලැබුණු තහවුරු කිරීමේ ලිපි අනුව මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂ රු.මිලියන 92කින් අඩුවෙන් හා රු.මිලියන 273කින් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

**2.2 රීති සහ රෙගුලාසි සමඟ අනුකූල නොවීම**

| | රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2016 අංක 03 දරන කම්කරුවන්ගේ ජාතික අවම වැටුප් පනත | තාක්ෂණික සහයකින් ලෙස බඳවා ගන්නා ලද මෙම සේවකයින්ගේ සේවක අංකය සහ කරන ලද වැඩ පිළිබඳව වැටුප් පත්‍රිකාවේ සඳහන් කර නොතිබුණි. | සෑම තාක්ෂණික සේවකයෙක් සඳහා යොමුගත ලියවිල්ලක් (TOR) ලබාදී ඇති අතර ඔවුන් සියලුදෙනාම සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ ලියාපදිංචි කර තනි අංකයක් ලබාදී ඇත. AHEAD ව්‍යාපෘතියේ කටයුතු සඳහා පහසුකම් සැපයීමට තාක්ෂණික සහයකයින්ගේ පත්කිරීම් අවශ්‍ය වේ. | පනතේ අවශ්‍යතා සමඟ අනුගත විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.1.2 වගන්තිය සහ 2017 ජුලි 03 දිනැති අංක ඩීඑම්එස්/7777/ AHEAD දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය | විශ්වවිද්‍යාල නවයක මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලවල වැටුප් ගෙවීම් පිළිබඳ 2021 දෙසැම්බර් කරන ලද අහඹු විගණන පරීක්ෂාවේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිසි අනුමැතිය ලබා ගැනීමකින් තොරව තාක්ෂණික සහායකයින් 24 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. පිළිවෙලින් රු. 127,068 සහ රු.31,766 ලෙස සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලේ දායකය ඇතුලුව දීමනා ලෙස එකතුව රු.1,217,658ක් ගෙවා තිබුණි. තවද, තාක්ෂණික නිලධාරීන් 35 දෙනෙකු විශ්වවිද්‍යාලවල මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලවල තාක්ෂණික සහායකයින් ලෙස අනුමැතියට පටහැනිව සේවයේ යොදවා තිබුණි. | ණය ගිවිසුමේ ප්‍රතිපාදනවලට අනුව ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ විට තාක්ෂණික සහායකයින්ගේ සේවාව ලබා ගැනීමට ව්‍යාපෘතියට හැකිවේ. පූර්ණකාලීන නිලධාරීන් දෙදෙනෙකු පමණක් සෑම OTSටම යොදවා ඇත. කටයුතු ක්‍රියාත්මක කිරීමට තාක්ෂණික සහායකයින්ගේ සහාය අවශ්‍ය වේ. | නිලධාරීන්ගේ බඳවා ගැනීමට නිසි අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 507(2) සහ 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය සහ අංක 05/2016 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛයේ 03 ඡේදයේ 3.1.7 සහ 3.2.7 වගන්ති | රු.මිලියන 2,762ක පිරිවැයකට මිලදී ගන්නා ලද අයිතම වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපතිවෙත ලබා දීමට ව්‍යාපෘති මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාල අසමත්වී තිබුණි. | මෙම භාණ්ඩ ඇතුළුව විශ්වවිද්‍යාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ලබා දෙනු ලැබේ. | මුදල් රෙගුලාසි සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.12.4 ඡේදය | 2021 දෙසැම්බර් 13 දීර්ඝකළ දින සිට මාස 05ක් ගතවී තිබුණද යාපනය විශ්වවිද්‍යාලය විසින් විද්‍යා පීඨයේ පරිගණක විද්‍යාගාරය ඉදිකිරීම වෙනුවෙන් සේවාව නිම කිරීමේ සහතිකය ලබාගෙන නොතිබුණි. | අවසාන බිල පරීක්ෂා කිරීම සිදුකරමින් පවතී. අවසාන ගෙවීම් සිදු කළ පසු සේවාව නිමකිරීමේ සහතිකය නිකුත් කරනු ලැබේ. | ප්‍රමාදයන් ආවරණය කිරීමට සහ අමතර පිරිවැය වළක්වා ගැනීමට කොන්ත්‍රාත් කටයුතු කාලීනව නිමකිරීම සහතික වීමට පියවර ගත යුතුය. |

**2.3 නිරවුල් නොකරන ලද ශේෂය**

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| නිසි අවශ්‍යතා විශ්ලේෂණයකින් තොරව මාසිකව මෙහෙයුම් අධීක්ෂණ සහාය කණ්ඩායමෙන් (OMST) අග්‍රිම ලෙස විශ්ව විද්‍යාලවල ස්ථාපනය කර ඇති මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාල (OTS) වෙත අරමුදල් ප්‍රතිලබ්ධි කර තිබුණි. එමනිසා විශ්වවිද්‍යාල 4ක OTSහි රු.74,447,755ක සැලකිය යුතු අත්තිකරම් මුදලක් නිරවුල් කිරීමකින් තොරව මාස 6ක් 12 කාලයක් පුරා පැවතුණි. | කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් උපකරණ බෙදාහැරීම සහ ඉදිකිරීම් කටයුතුවලට බලපා ඇති අතර ගෙවීම්වල ප්‍රමාදයන් සිදුවී ඇත. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගතයුතු අතර විශ්වවිද්‍යාලවල කටයුතු පිළිබඳ අධීක්ෂණ ක්‍රියාවලිය සිදුකළ යුතුය. විශ්ව විද්‍යාලවල නිශ්කාර්ය අරමුදල් පැවතීම වැළැක්වීමට අරමුදල් ලබා දීමට පෙර කටයුතුවල නිවැරදි වටිනාකම ඇස්තමේන්තු කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 කටයුතුවල මූල්‍ය ප්‍රගතිය**

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතියේ වැඩසටහන් සංරචකය ප්‍රතිඵල කලාප 3ක් සහ වියපැහැදම් සම්බන්ධ දර්ශක 6ක් යටතේ මෙහෙයවනු ලැබේ. විස්තර පහත දැක්වේ.

**වැඩසටහන් සංරචකය**

ප්‍රතිඵල කලාප 1 - ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමුඛතා විෂයයන් සඳහා උසස් අධ්‍යාපනයට ඇතුලත්වීම වැඩි කිරීම
ප්‍රතිඵල කලාප 2 - උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩිකිරීම
ප්‍රතිඵල කලාප 3 - පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම
**ව්‍යාපෘති සංරචකය -** මෙහෙයුම් සහ අධීක්ෂණ සහය කණ්ඩායම

| | සංරචකය/ උප සංරචකය | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ප්‍රතිඵල කලාප 1 | | | |
| | (i) උපකරණ | උපකරණ සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් විශ්ව විද්‍යාල 2ක් හැර අනෙකුත් විශ්වවිද්‍යාල 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදිත අරමුදලින් සියයට 55ක්වත් උපයෝජනය කර නොතිබුණි. | **නැගෙනහිර විශ්වවිද්‍යාලය** - උපකරණ මිලදී ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය දීර්ඝ කාාලයක් ගෙන ඇත.<br><br>**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය** ප්‍රතිපාදන 2021.02.25 දින අනුමත කර තිබුණි.<br><br>**සබරගමුව සහ අග්නිදිග** | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරන ප්‍රසම්පාදන කටයුතු නියාමනය සහ අධීක්ෂණය පිළිබඳ දැඩි සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක |

| | | | | |
|---|---|---|---|---|
| | | | **විශ්වවිද්‍යාලය -** ආනයන සීමා සහ විනිමය අනුපාත විචලනයන් හේතුවෙන් සැපයුම්කරුවන් අපහසුතාවයන්ට මුහුණදී ඇත.<br><br>**ගම්පහ වික්‍රමාරච්චිය -** ප්‍රතිපාදන 2021.07.30 ලබාදී ඇත.<br><br>**අධ්‍යාපන අමාත්‍යාංශය -** අධ්‍යාපන අමාත්‍යාංශයට රු.මිලියන 5.13ක් අනුමත කර ඇත. | කළ යුතුය. |
| | (ii) සිවිල් කටයුතු | සිවිල් කටයුතු සඳහා වෙන්කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් එක විශ්වවිද්‍යාලයක් හැර අනෙකුත් විශ්වවිද්‍යාල 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදිත මුදලින් සියයට 25ක්වත් උපයෝජනය කර නොතිබුණි. | කොවිඩ් 19, ගොඩනැගිලි ද්‍රව්‍ය හිඟකම, මිල විචලනයන්, ශ්‍රමිකයන්ගේ හිඟය යනාදි හේතුවෙන් ඉදිකිරීම් කටයුතුවලට බලපාන ලදි. | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට පියවර ගත යුතු අතර අමතර පිරිවැය වළක්වා ගැනීමට කාලීනව කොන්ත්‍රාත් කටයුතු නිමකිරීමට සහතික විය යුතුය. |
| (ආ) | ප්‍රතිපල කලාප 3<br>(i) විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකක (UBL CELL) | විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකක සඳහා කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් අඩුම වශයෙන් සියයට 56.5ක ප්‍රතිශතයක් උපයෝජනය කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හැර අනෙකුත් සියලුම විශ්වවිද්‍යාල 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 15ක ප්‍රතිපාදිත මුදලින් සියයට 47කට වඩා අඩු ප්‍රතිශතයක් පමණක් උපයෝජනය කර තිබුණි. | විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකවල කටයුතු අදියර 4කට වෙන්කර ඇති අතර සෑම අදියරයක් නිමකිරීමෙන් පසු ඉහත වාරික ලබාදෙනු ඇත. | ව්‍යාපෘති කාලය තුළදී මුළු ප්‍රතිපාදනය උපයොජනය කිරීම අවශ්‍ය වේ. |
| | (ii) පර්යේෂණ හා නවෝත්පාදන වාණිජකරණය කිරීම | පර්යේෂණ හා නවෝත්පාදන වාණිජකරණය සඳහා කරන ලද මුළු ප්‍රතිපාදනයන් නැගෙනහිර, කැලණිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල සහ රුහුණු විශ්වවිද්‍යාලය 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදිත මුදලින් අවම වශයෙන් සියයට 50ක්වත් උපයෝජනය කර නොතිබුණි. | කොවිඩ් 19 හේතුවෙන් වසා දැමීම්, ආනයන සීමා සහ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ ගැටළු මූල්‍ය ප්‍රගතිය කෙරෙහි බලපා ඇත. | ප්‍රමාද වූ කටයුතු තවදුරටත් ප්‍රමාදයකින් තොරව ආවරණය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) සංවර්ධනය ඉලක්ක කරගත් පර්යේෂණ | සංවර්ධනය ඉලක්ක කරගත් පර්යේෂණ සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් නැගෙනහිර අග්නිදිග විශ්වවිද්‍යාල 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදිත මුදලින් අවම වශයෙන් සියයට 25ක්වත් උපයෝජනය කර නොතිබුණි. | -එම- | ප්‍රමාදවූ කටයුතු තවදුරටත් ප්‍රමාදයකින් තොරව ආවරණය කරගත යුතුය . |
| (iv) පීඑච්ඩී | අධ්‍යන කාර්ය මණ්ඩලයේ 199කින් විදේශයන්හි ඔවුන්ගේ දර්ශනපති උපාධිය හදාරණ අධ්‍යන කාර්ය මණ්ඩලයේ 97දෙනාගේ සහ සිලිට් ආයතනයේ ශාස්ත්‍රපති උපාධිය හදාරණ අධ්‍යන කාර්ය මණ්ඩලික නිලධාරියකු ව්‍යාපෘති නිම කරන 2023 ජුනිවලින් පසුවද ඔවුන්ගේ වැඩසටහන් අඛණ්ඩව සිදු කරනු ලැබේ. මෙම 98 දෙනා සඳහා 2021 දෙසැම්බර් 31 දිනට දරන ලද පිරිවැය රු.251,231,483කි. | මේ පිළිබඳ 2022.06.24 දින මෙහෙයුම් කළමනාකරණ සහය කණ්ඩායම්/ ලෝක බැංකු කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ජා කරන ලද අතර මෙම ගැටලුව අමාත්‍යාංශයේ අවධානයට ගෙන ඒමට තීරණය විය. | වැඩසටහන් ඇගයීම් ලේඛණවල සඳහන් අවශ්‍යතා සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |

## 3.2 ක්‍රියාකරකම්වල භෞතික ප්‍රගතිය

| | සංරචකය /උප සංරචකය | විගණන ගැටලු | කළමනකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පර්යේෂණ හා නවෝත්පාදන වාණිජකරණය කිරීම | ප්‍රදානය කරන ලද රු.මිලියන 45ක මුළු මුදලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රසායනික විද්‍යා දෙපාර්තමේන්තුව ස්වාභාවික රබර්වල අගය එකතු කිරීමේ මෙවලමක් ලෙස නැනෝ ද්‍රව්‍ය යොදා ගැනීම පිළිබඳ යෝජනාව සඳහා එකතුව රු.මිලියන 39.3ක් උපයෝජනය කර තිබුණි. යෝජනාවට අනුව ක්‍රියාත්මක දිනය 2018.10.05 වන අතර ගිවිසුමට අනුව එය 2018.11.12 වේ. | කොවිඩ් 19 හේතුවෙන් වසා දැමීම්, අපනයන සීමා, ප්‍රසම්පාදන ගැටලු, විද්‍යාගාරවල පිවිසීම සලකමින් මෙම ව්‍යාපෘතිය 2022.12.31 දක්වා දීර්ඝ කරන ලදි. | වැඩසටහන් ඇගයීම් ලේඛණවල සඳහන් අවශ්‍යතා සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ආ) | පර්යේෂණ හා නවෝත්පාදන වාණිජකරණය කිරීම පළමු වටය | ප්‍රදානය කරන ලද රු.මිලියන 35ක මුළු මුදලින් 2021 දෙසැම්බර් 31 දිනට රුහුණු විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් තත්‍ය කාලීන කෘෂිකාර්මික ජංගම දුරකථන පදනම් කරගත් තොරතුරු පද්ධතියක් | කොවිඩ් 19 හේතුවෙන් වසා දැමීම්, අපනයන සීමා, ප්‍රසම්පාදන ගැටලු, විද්‍යාගාරවල පිවිසීම සලකමින් මෙම ව්‍යාපෘතිය | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | වාණිජකරණය කිරීමේ යෝජනාව මත (ගොවි නැණ) එකතුව රු.මිලියන 19ක් උපයෝජනය කර තිබුණි. යෝජනාව අනුව ක්‍රියාත්මක දිනය 2018.10.02 වන අතර ගිවිසුමට අනුව 2018.10.21 වේ. | 2022.12.31 දක්වා දීර්ඝ කරන ලදි. | |
| (ඇ) | සංවර්ධනය ඉලක්ක කරගත් පර්යේෂණ පළමු වටය | ප්‍රදානය කරන ලද රු.මිලියන 35ක මුළු මුදලින් 2021 දෙසැම්බර් 31 දිනට රුහුණු විශ්වවිද්‍යාලයේ ජෛව රසායන පීඨය විසින් දියවැඩියා රෝගය සඳහා පෝෂණ ඖෂධයක් සංවර්ධනය කිරීමට Ivy gourd (Coccinia Grandis) පත්‍ර සාරය සමඟ සංවෘත නැනෝ අංශු මත පදනම් වූ සංයෝගවල ජෛව ක්‍රියාකාරීත්වය සහ විෂ විද්‍යාත්මක අධ්‍යයනය සඳහා එකතුව රු.මිලියන 20.4ක් උපයෝජනය කර තිබුණි. යෝජනාව අනුව ක්‍රියාත්මක දිනය 2019 අප්‍රේල් වන අතර ගිවිසුමට අනුව 2019 මාර්තු වේ. | කොවිඩ් 19 හේතුවෙන් වසා දැමීම්, අපනයන සීමා, ප්‍රසම්පාදන ගැටලු, විද්‍යාගාරවල පිවිසීම සලකමින් මෙම ව්‍යාපෘතිය 2022.12.31 දක්වා දීර්ඝ කරන ලදි. | -එම- |
| (ඇ) | සංවර්ධනය ඉලක්ක කරගත් පර්යේෂණ දෙවන වටය | ප්‍රදානය කරන ලද රු.මිලියන 40ක මුළු මුදලින් 2021 දෙසැම්බර් 31 දිනට රුහුණු විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් දේශීය බැක්ටීරියා හුදකලාව භාවිත කරමින් ශ්‍රී ලංකාවේ මිරිදිය ඇල්ගී පිපීම පාලනය කිරීම සඳහා හරිත තාක්ෂණික ප්‍රවේශය සඳහා එකතුව රු.මිලියන 27.9ක් උපයෝජනය කර තිබුණි. යෝජනාව අනුව ක්‍රියාත්මක දිනය 2019 ජුනි වන අතර ගිවිසුමට අනුව 2019 මැයි වේ. | කොවිඩ් 19 හේතුවෙන් වසා දැමීම්, අපනයන සීමා, ප්‍රසම්පාදන ගැටලු, රටවල් හරහා සාම්පල එකතුකිරීමේ ගැටලු, විද්‍යාගාරවල පිවිසීම සලකමින් මෙම ව්‍යාපෘතිය 2022.11.3 දක්වා දීර්ඝ කරන ලදි. OMST 2022 ප්‍රගතිය සමාලෝචනය කරනු ලබන අතර තවදුරටත් දීර්ඝ කිරීම ලබාදෙනු ලැබේ. | -එම- |
| (ඉ) | **පීඑච්ඩී පිළිබඳ තොරතුරු** | | | |
| | | සියලුම විශ්වවිද්‍යාලවල මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාල පහළොවෙන් සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයෙන් තොරතුරු කැඳවන ලදි. කෙසේවෙතත්, කොළඹ, යාපනය, මොරටුව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, රජරට, සබරගමුව, අග්නිදිග විශ්වවිද්‍යාලය, සෞන්දර්ය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනවල මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාල පීඑච්ඩී සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමට අසමත්වී තිබුණි. | සියලුම මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලවල අධ්‍යක්ෂවරුන්ට විගණන විමසුම්වලට ප්‍රතිචාර දැක්වීමට සහ ප්‍රමාදයකින් තොරව ඉල්ලන තොරතුරු ලබා දීමට දැනුවත් කරනු ලැබේ. | ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |
| | | අධ්‍යන කාර්යය මණ්ඩලයේ දොළොස් දෙනෙකු සිය දර්ශනපති/ශාස්ත්‍රපති උපාධි නිමකර 2022 අප්‍රේල් 30 දිනට හෝ ඊට පෙර විශ්වවිද්‍යාලයට වාර්තා කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, 2022 මැයි 30 දින මෙහෙයුම් කළමනාකරණ සහාය කණ්ඩායම් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සහ 2022 අප්රේල් මාසය තුළදී විශ්වවිද්‍යාප | කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් ප්‍රදානලාභීන්ට පීඑච්ඩී වැඩසටහන අපේක්ෂිත පරිදි නිමකිරීමට නොහැකි විය. | ගිවිසුමේ සඳහන් අවශ්‍යතා සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |

හතක් මගින් තහවුරු කරන ලද තොරතුරු අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යන කාර්යය මණ්ඩලයේ දෙදෙනෙකු පමණක් වැඩසටහන නිමකර රාජකාරියට වාර්තා කර තිබුණි.

| | | | |
|---|---|---|---|
| (i) | 2016.11.01 දින ඉන්දියාවේ දර්ශනපති උපාධිය ආරම්භ කරන ලද කොළඹ විශ්වවිද්‍යාලයේ අයදුම්කරුවෙකු 2020.11.30 දින විශ්ව විද්‍යාලයට නැවත පැමිණීමට අපේක්ෂා කර තිබුණු අතර 2020.03.01 දින විශ්වවිද්‍යාලයට පැමිණ තිබුණි. කෙසේවෙතත්, ඇය 2022.05.30 දිනවන විටත් ඇයගේ අවසන නිබන්ධනය ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රදානලාභියා විශ්ව විද්‍යාලයට නැවත පැමිණි නිවැරදි දිනය සනාථ කර තිබුණි. නමුත් අවසාන නිබන්ධනය මෙහෙයුම් කළමනාකරණ සහාය කණ්ඩායම් වෙත භාර දීමට නියමිතව ඇති අතර අවසන් කිරීමෙන් පසු ඉදිරිපත් කිරීමට එකඟ විය. | ගිවිසුමේ සඳහන් අවශ්‍යතා සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. |
| (ii) | පිළිවෙලින් පිරිවැය රු. 9,007,872, රු.6,266,186 සහ රු. 4,500,000 සහිත නවසීලන්තය, මැලේසියාව සහ ඇමරිකා එක්සත් ජනපදයහි දර්ශනපති උපාධිය හැදෑරීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අයදුම්කරුවන් තිදෙනෙකු පිළිබඳව එකතු කරන ලද තොරතුරු අනුව ඔවුන් 2022 පෙබරවාරි, අප්‍රේල් සහ 2020 මැයි නැවත පැමිණීමට නියමිත වේ. කෙසේවෙතත්, ලැබී තිබුණු තොරතුරු අනුව එක් අයදුම්කරුවෙකු 2022.01.25 දින සිට බලපැවෙත් වෙන පරිදි ඉවත්වී තිබුණි. (නිමකිරීමේ දිනය 2022.04.10 සහ විශ්ව විද්‍යාලයට පැමිණීමට නියමිත දිනය 2022.01.31) දෙවැනි අයදුම්කරු විශ්ව විද්‍යාලයට නැවත පැමිණෙන දිනය විශ්ව විද්‍යාලය විසින් සනාථ කර නොතිබුණි. 2016දී සිය පීඑච්ඩී උපාධිය ආරම්භ කළ තෙවැනි අයදුම්කරු 2021.12.31 දින නැවත පැමිණ ඇත. AHEAD මගින් මූල්‍යනය 2018.11.01 දින ආරම්භ කර ඇත. කෙසේවෙතත්, මේ පිළිබඳ තත්ත්වය යාවත්කාලීන කිරීමට සහ ඉහත අයදුම්කරුවන් තිදෙනා පිළිබද පියවර ගැනීමට 2022.05.330 දිනවන විටත් OMST අසමත්ව නොතිබුණි. | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පරිපාලන ශාඛාවට අනුව<br><br>**නවසීලන්තයේ පළමු ප්‍රදානලාභී-**<br>කවුන්සිලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඇය එම තනතුරින් ඉවත් වුවා සේ සහ බැඳුම්කරය කඩකළ අයෙකු ලෙස සලකයි.<br><br>**මැලේසියාවේ දෙවැනි ප්‍රදානලාභියා-**<br>රාජකාරිය සඳහා නැවත වාර්තා කර ඇති අතර ඇයගේ සහතිකය මේවන තෙක් ඉදිරිපත් කර නොමැත.<br><br>**ඇමරිකා එක්සත් ජනපදයේ තෙවැනි ප්‍රදානලාභියා-**<br>මේවන තෙක් ඔහුගේ සහතිකය ඉදිරිපත් කර නොමැත. | -එම- |
| (iii) | වයඹ විශ්ව විද්‍යාලයේ අයදුම්කරුවන් දෙදෙනෙකු ඔවුන්ගේ පීඑච්ඩී වැඩසටහන 2022 මාර්තු සහ අප්‍රේල් නිමකළ යුතු වුවද 2022.05.30 දින වනවිටත් වැඩසටහන නිමකිරීමට දෙදෙනාම අසමත්වී තිබුණි. | අයදුම්කරුවන් දෙදෙනාම නිබන්ධනය ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් ප්‍රමාදයන් ඇතිවී තිබුණි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iv) | පිළිවෙලින් රු.908,750, රු. 589,300 සහ 571,600 පිරිවැයක් සහිතව ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රපති උපාධියක් දැරීමට ප්‍රදාන ලැබූ සිලිට් ආයතනයේ අයදුම්කරුවන්ගෙන් ලැබුණු තොරතුරු අනුව 2021 අප්‍රේල් සහ නොවැම්බර් හා 2022.03.30 දින නිම කිරීමට අපේක්ෂිත විය. කෙසේවෙතත්, මෙහෙයුම් කළමනාකරණ සහාය කණ්ඩායම් ලබාදෙන ලද තොරතුරු අනුව 2022.05.30 දින වන විටත් ඔවුන් නිමකර නොතිබුණි. | කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් අයදුම්කරුවන්ට නිම කිරීමට නොහැකි විය. | -එම- |
| (v) | නැගෙනහිර විශ්වවිද්‍යාලයේ අයදුම්කරුවෙකු වෙත නවසීලන්තයේ කැන්ටබරි විශ්ව විද්‍යාලයේ වර්ෂ 3ක පීඑච්ඩී උපාධි වැඩසටහනක් රු. 1,124 ,432.75ක පිරිවැයකට පිරිනමා තිබුණි. ආරම්භක දිනය 2021.02.01 වූ අතර නිමකළ යුතු දිනය 2024.01.31 විය. නැගෙනහිර විශ්වවිද්‍යාලයෙන් ලැබුණු තොරතුරු අනුව මෙම අයදුම්කරු වැඩසටහන අතහැර දමා තිබුණි. මෙහෙයුම් කළමනාකරණ සහාය කණ්ඩායම් 2022.05.30 දින වන විටත් රු. 1,124,432.75ක මුදල අයකරගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | ප්‍රදානලාභියා මුදල නැවත ලබාදීමට එකඟවී ඇත. | ප්‍රදානලාභියාගෙන් මුදල අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (vi) | 2021 අන්තර් ප්‍රතිඵල දර්ශක අනුව විද්‍යාව, තාක්ෂණය,ඉංජිනේරු සහ ගණිත වැඩසටහන මගින් SLIATE ආයතනය 4 වන වර්ෂය අවසාන වනවිට ශිෂ්‍යන්ගේ බඳවා ගැනීම් අඩුම වශයෙන් 4,600කින් වැඩිකර ගත යුතුවේ. කෙසේවෙතත්, ශිෂ්‍යයින් සම්බන්ධවී නොමැති අතර මෙම ඉලක්කය සිලිට් ආයතනය විසින් ළඟාකරගෙන නොතිබුණි. | සිලිට් ආයතනයෙන් තොරතුරු ලබා ගැනීම අවශ්‍ය අතර අපගේ ප්‍රතිචාරය වෙනම ලබාදෙනු ලැබේ. | වැඩසටහන් ඇගයීම් ලේඛණයේ සඳහන් අවශ්‍යතා සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. |

## 3.3 ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ /ක්‍රියාත්මක කිරීමේ/නිම කිරීමේ ප්‍රමාදයන්

| | ක්‍රියාකාරකම් | ආරම්භ කිරීමට /ක්‍රියාත්මක කිරීමට/නිම කිරීමට සැලසුම් කළ දිනය | ආරම්භ කළ /ක්‍රියාත්මක කළ/නිම කළ දිනය | ප්‍රමාදය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු සහ ලෝක බැංකුව අරමුදල් මඟින් සිදු කරන ගණුදෙනු ගිණුම්ගත කිරීමට විශ්ව විද්‍යාලවල OMST සහ OTS වල ස්වයංක්‍රීය ගිණුම්කරන පද්ධතියක් භාවිතා කිරීමට යෝජනා කරන ලදි. | පද්ධතිය 2019.07.29 ස්ථාපනය කළ යුතුය. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2019.07.03 නිමකර ඇති අතර 2019.07.22 කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර ඇත. | අවුරුදු 2යි මාස 09ක් ගතවී ඇතත් 2022.04.30 දිනට OTS මට්ටමට පද්ධතිය දීර්සකර නොතිබුණි. | ඉහළ පිරිවැයක් දැරීමට සිදුවීම නිසා පොදු ස්වයංක්‍රීය ගිණුම්කරන පද්ධතියක් ස්ථාපනය කර නොමැත. | වැඩසටහන් ඇගයීම් ලේඛණයේ සඳහන් අවශ්‍යතා සමඟ අනුකූල විම අවශ්‍ය වේ. |
| (ආ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇණවුම් කරන ලද පහත සඳහන් අයිතම් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණි. මෙම ඇණවුම් වර්ෂයකට වඩා වැඩි කාලයක් පුරා බෙදාහැර නොතිබුණි. | | | | | |
| (i) | විද්‍යා පීඨය ඩිජිටල් හැඳුනුම්පත් මුද්‍රණ යන්ත්‍රය රු. 375,840 | 2020.03.06 කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | බෙදාහැර ඇත. නමුත් 2021.12.31 දිනට නිසි පරිදි ක්‍රියාත්මක නොවේ. | අවුරුදු 1යි මාස 09කට වඩා කාලයක් බෙදාහැර නොතිබුණි. | අයිතමය බෙදාහැර ඇත. නමුත් අක්‍රීයවීම හේතුවෙන් භාණ්ඩ භාර ගැනීමේ කමිටුව ප්‍රතික්ෂේප කර ඇත. අඩුපාඩු සැපයුම්කරු දැනුවත් කර අයිතමය 2022.02.25 දින නැවත සැපයුම්කරු වෙත යවා ඇත. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ නියාමනය සහ අධීක්ෂණය සම්බන්ධයෙන් දැඩි සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ii) | කෘෂිකර්ම පීඨය හීටරයක් සහිත Soxhlet නිස්සාරකය රු.542,547 | 2019.11.18 කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | කොටසක් බෙදාහැර ඇත. | අවුරුදු 2ක් තිස්සේ බෙදාහැර නොතිබුණි. | භාණ්ඩ ලැබී ඇත. නමුත් අසම්පූර්ණ වේ. | -එම- |
| (iii) | කළමනාකරණ පීඨය කණ්ඩායම් වැඩ ස්ථාන රු.314,640 | 2019.10.17 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | 2021.12.31 දිනට බෙදාහැර නොමැත. | අවුරුදු 2ක් තිස්සේ බෙදාහැර නොතිබුණි. | වර්තමාන තත්ත්වය හේතුවෙන් ප්‍රමාදයන් පිළිගැනීමට සිදුවිය. | -එම- |
| (iv) | කළමනාකරණ පීඨය සාකච්ඡා මේස රු.53,110 | 2019.12.14 දින කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. | 2021.12.31 දිනට බෙදාහැර නොමැත. | අවුරුදු 2ක් තිස්සේ බෙදාහැර නොතිබුණි. | භාණ්ඩ සැපයීමට නොහැකි බව සැපයුම්කරු දන්වා ඇත. අයිතම අවලංගු කර ඇත. | -එම- |
| (v) | කළමනාකරණ පීඨය බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය රු.275,820 | 2020.08.27 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | 2021.12.31 දිනට බෙදාහැර නොමැත. | අවුරුදු 1 මාස 4 තිස්සේ බෙදාහැර නොතිබුණි. | තෝරාගත් සැපයුම්කරු භාණ්ඩ සැපයීමට නොහැකි බව දන්වා ඇත. | -එම- |
| (vi) | කෘෂිකර්ම පීඨය (ජලයේ තත්ත්ව විශ්ලේෂණය සඳහා ද්විත්ව ආදාන සහිත අතේ ගෙන යා හැකි Multipara මීටර් කට්ටලය) රු.693.081 | 2019.10.03 කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | 2021.12.31 දිනට බෙදාහැර නොමැත. | අවුරුදු 02 මාස 03ක් පුරා බෙදාහැර නොමැත. | භාණ්ඩ ලබාදී ඇති නමුත් පරීක්ෂණය ක්‍රියාත්මක නොවන නිසා කණ්ඩායමට ලබා දුන් අයිතම පිළිගැනීමට නොහැක. | -එම- |
| (vii) | දන්ත පීඨය විද්‍යුත් ඇපෙක්ස් ලොකේටර් (Electronic Apex Locaters) රු.626,400 | 2020.10.27 කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | 2022.03.22 දක්වා බෙදාහැර නොමැත. | අවුරුදු 01 මාස 03ක් පුරා බෙදාහැර නොමැත. | සැපයුම්කරු මුහුණපාන ලද ගැටලු හේතුවෙන් බෙදාහැරීම ප්‍රමාදවී ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් අවශ්‍යතා සමඟ අනුකූල වීමට සැපයුම්කරු පෙළඹවීම අවශ්‍ය වේ. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (viii) | කළමනාකරණ පීඨය මහල් 2කින් යුත් යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම<br>රු. මිලියන 35 | 2020.08.19 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | ප්‍රගතිය 40% | - | සාකච්ඡා පවත්වනු ලැබේ. 80% නිමකර ඇත. | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට කටයුතු කළ යුතු අතර අමතර පිරිවැය ඇතිවීම වැළැක්වීමට කොන්ත්‍රාත්තුව නියමිත දිනට අවසන්වන බවට සහතික විය යුතුය. |
| (ix) | විද්‍යා පීඨය පවතින විශ්ලේෂණ පර්යේෂණ රසායනාගාරය වැඩිදියුණු කිරීම<br><br>රු. 413,700 | 2020.08.31 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | සිදුකරමින් පවතී. | - | ද්‍රව්‍ය හිඟය හේත්වෙන් සමහර සිවිල් කටයුතු නිමකළ නොහැකි විය. | -එම- |
| (x) | විශ්වවිද්‍යාලය විසින් ඇණවුම් කරන ලද රු.මිලියන 5.01ක් වටිනා අයිතම 1,334ක් 2021.12.31 දින වන විටත් සැපයුම්කරු විසින් සපයා නොතිබුණි. | 2021 වර්ෂයේදී ගිවිසුම අත්සන් කර ඇත. | නිමකළ යුතු දිනය 2021 මාර්තු සිට දෙසැම්බර් දක්වා වේ. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් භාණ්ඩ ලැබී නොතිබුණි. | සැපයුම්කරු විසින් මුහුණ දෙන ලද අපහසුතාවයන් | කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් අවශ්‍යතා සමඟ අනුකූල වීමට සැපයුම්කරු පෙළඹවීම අවශ්‍ය වේ. |
| (ඇ) | **ELTA ELSE -කලා පීඨය** විශේෂ අවශ්‍යතා සම්පත් මධ්‍යස්ථානයේ අළුත්වැඩියාව සහ පුළුල් කිරීම සඳහා රු.මිලියන 2.76කින් එකතුව රු.570,611ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර භාරදී නොතිබුණි. | ගිවිසුම්ගත දිනය 2021.03.02 | නිම කළයුතු දිනය 2021.06.02 | - | කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත වැඩ විචලතා එකතු කිරීමට 2021.11.15 දක්වා කටයුතු නිම කිරීමට දීර්ඝ කිරීම් ලබාදී ඇත. | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට කටයුතු කළ යුතු අතර අමතර පිරිවැය ඇතිවීම වැළැක්වීමට කොන්ත්‍රාත්තුව නියමිත දිනට අවසන්වන බවට සහතික විය යුතුය. |
| (ඇ) | රු.මිලියන 2.74කට රසායනාගාර-විදුලි රැහැන්; රසායනාගාර ආරක්ෂාව සහ | ගිවිසුම්ගත දිනය 2021.08.12 | නිමකළ යුතු දිනය 2021.11.12 | - | 2022.05.26 දින කොන්ත්‍රාත්කරු ඇණවුම සම්පූර්ණ කළ නොහැකි බව | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | දොරවල් ඇතුළු ප්‍රවේශ විධිවිධාන; රසායනාගාර ජාලකරණය; - සංඥා; රසායනාගාර කොටස් වෙන්කිරීම; රසායනාගාර ජාල රැහැන්; ඇතුළුව බහුමාධ්‍ය රසායනාගාරය පුනරුත්ථාපනය සහ අළුත්වැඩියාව සිදුකර 2021.12.31 වන විටත් නිම කර භාරදී නොතිබුණි. | | | | දන්වා ඇත. ලංසු නැවත කැඳවා ඇත. | |
| (ඉ) | **ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය** රු.මිලියන 20.2කට සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය සඳහා ශිෂ්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීම | කොන්ත්‍රාත්තුව 2020.02.24 දින ප්‍රදානය කර ඇත. | 2021.12.31 දින වන විටත් නිමකර භාරදී නොතිබුණි. | - | කොවිඩ් 19 හේතුවෙන් ප්‍රමාදයන් සිදු වී ඇත. | -එම- |
| (ඊ) | **ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය** රු.මිලියන 7.18ක පිරිවැයකට කළමනාකරණ අධ්‍යන පීඨය සඳහා ආදර්ශ මුළුතැන්ගෙය පුළුල් කිරීම සහ අලුත්වැඩියාව | කොන්ත්‍රාත්තුව 2020.05.19 දින ප්‍රදානය කර ඇත. | 2021.12.31 දින වන විටත් නිමකර භාරදී නොතිබුණි. | - | කොවිඩ් 19 සහ භාණ්ඩ නොමැතිවීම හා ඉන්ධන ගැටලුව හේතුවෙන් කටයුතු ප්‍රමාදවී ඇත. | -එම- |
| (උ) | **රුහුණු විශ්වවිද්‍යාලය** රු.මිලියන 1.2කට පියලි සලකුණු (Ice Flake Marker) යන්ත්‍රය මිලදී ගැනීම. | කොන්ත්‍රාත්තුව 2021.08.02 දින ප්‍රදානය කර ඇත. | 2021.12.31 දින වන විටත් ලැබී නොතිබුණි. | - | රටෙහි පැවති වර්තමාන තත්ත්වය හේතුවෙන් සැපයුම් ප්‍රමාදවී ඇත. එම නිසා භාණ්ඩය සඳහා නැවත ලංසු කැඳවා ඇත. | -එම- |